## ඇත්තෙන්ම කායික දඬුවමට එරෙහිව නැගී සිටීම නූතන බටහිර රැල්ලකින් මතුවූවක්ද?

නැත! කායික දණ්ඩනයට විරුද්ධවූ සිංහල රජවරුන් ගැන කොතෙකුත් පොත පතේ සදහන් වේ. එපමණක්ද නොවේ. ශ්‍රී ලාංකික නිදහස් අරගලයේ සමකාලීන ප්‍රබලයන් වූ සයිමන් කේසි චෙට්ටි (1943), ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් (1879) වැන්නවුන් කායික දඬුවම් අහෝසි කිරීම පිණිස එවක ව්‍යවස්ථා මණ්ඩල බලධාරීන් ඉදිරියේ දැඩිව හඬ නගා ඇති බව අමතක නොකල යුතුය. තරුණයින්ට කායික දඬුවම් පැමිණ වීමට 1916 දී එම්. ටී. අක්බාර් මැතිදුන් විසින් තදබල විරෝධයක් ඇතිකිරීම ඊට කදිම නිදසුනකි.

1943, වසරේදී ශ්‍රීමත් බාරොන් ජයතිලක. ශ්‍රීමත් ක්ලෝඩ් කොරයා, ශ්‍රීමත් සුසන්ත. ද. ෆොන්සේකා, ජේ. ආර්. එම්. ඔබේසේකර සහ වී.ආර්. සවරිමුත්තු යන මහත්වරුන් ඇතුළු කමිටුවක් විසින් කායික දඬුවමට එරෙහිව වාර්තාවක්ද ඉදිරිපත් කෙරිණි. එහි මෙවැන්නක් සදහන් වේ.

."......දරුවකුගේ වරදකාරී බවට ඔහුගේ/ඇයගේ නිසග දුෂ්ඨ, නපුරු බව මුළුමනින්ම හේතුවී ඇති බවත්. එම නිසග ස්වභාවයන් පලවා හැරිය හැක්කේ දැඩි දඬුවම් පැමිණවීමෙන් බවත් යන පිළිගැනීම තවදුරටත් සාධාරණීකරණය කල නොහැකි බව පෙනේ. නවීන චින්තනයට අනුව වැඩිහිටි අපගේ අවධානය යොමුවිය යුත්තේ ළමා වරදකරුවන්ට ලබා දෙන දඬුවම් වල ස්වභාවය පිළිබදවය. මෙම විෂය පිළිබදව ඉතා ගැඹුරින් මෙන්ම සානුකම්පිතව සලකා බැලීමේදී, අපරාධ විමර්ශනය පිළිබද හසල දැනුමක් ඇති නිලධාරීන් ප්‍රකාශ කරන අන්දමට ළමයින් අතින් කෙරෙන අපරාධ වලට මූලික හේතුව වන්නේ 'බාහිර සමාජයීය බලපෑම්' බවයි. මෙම බලපෑම් ඇතිවන්නේ ළමයා අවට තිබෙන සංකීර්ණ සමාජය විසින් ළමයාගේ ස්වභාවික නිරෝගී, නොකිලිටි භාවය නතුකර ගැනීම නිසාය. ඉහත බලපෑම් මෙන්ම ළමයින් තුළපවතින ශාරීරික හා මානසික ව්‍යාකූලතාවන්ද ළමයාගේ අනුදැනුමකින් තොර වේ. මේ අනුව අප අවසානයේ එළඹෙන තීරණය වන්නේ එකට එක කිරීමේ හෙවත් පළිගැනීමේ අදහසින් දරුවන්ට දඬුවම් පැමිණවීම තවදුරටත් වලංගු නොවන බවය. එහෙත් අපරාධ වැලැක්වීම පිණිස දරුවන් හික්මවීම වලංගු වේ. එසේම ළමා වරදකරුවන් පිළිබද මූලික ක්‍රියා පටිපාටියට මුල්විය යුත්තේ දරුවන් පුනරුත්ථාපනය කිරීමේ අරමුණයි....."..

**එවක රාජ්‍ය මන්ත්‍රණ සභා විවාදයකදී, 'පාසල් දරුවන් හට ගුරුවරුන් විසින් පමුණුවන දඬුවම්' පිළිබද මහාමාත්‍ය ඩී. එස් සේනානායක මහතා කර ඇති ප්‍රකාශයක් මෙසේ "මට දරුවන්ට දඬුවම් පමුණුවන ගුරුවරු/වැඩිහිටියන් දුටු විට සිතෙනුයේ ඔවුන්ගේ බෙල්ලෙන් අල්ලා වැඩ ගැනීමටයි. අපි සතුනට දක්වන කෲරත්වය ගැන කතා කලත් ළමයින්ට පෙන්වන කෲරත්වය ගැන කතා නොකරමු. වැඩුණු මේරූ පුද්ගලයන් විසින් කුඩා දරුවන් ලවා බලහත්කාරයෙන් වැඩ පල කරවා ගැනීම මගේ මනසට අප්‍රිය ජනකයි".**


**1935දී වෛද්‍ය එස්. ඒ. වික්‍රමසිංහයන් විසින් කරන ලද ප්‍රකාශයකි මේ.**
"'........අප රටේ ළමයින්ට විඳින්නට සිදුවන කෲර ගැහැට පිළිබදව සවිස්තරාත්මකව කතා කිරීම අවශ්‍ය නැත ඒ තරමටම එය අප රටේ පැතිරුණු ව්‍යසනයකි. නීතිය ඉදිරියට පැමිණවූ ළමා වදහිංසා හා දැඩි දඬුවම් පසෙක තැබුවහොත් සාමාන්‍ය මහජන මතය වන්නේ දැඩි දඬුවම්, ළමයින් ඇති දැඩි කිරීමේ අත්‍යවශ්‍ය අංගයක් බවයි දරුවන්ට පොලිස් හා අධිකරණ වලදී දඬුවම් ලෙස ඉතා දැඩි අනුකම්පා විරහිත පහරදීම වලට ලක්වීමට සිදුවේ. සෑම පාසලකම පාහේ වේවැලෙන් තැලීම අනිවාර්යයෙන් සිදුවේ. අප රට තුල දරුවන්ට මානසිකව හා කායිකව හානි කිරීම කෙතරම් ප්‍රචලිතද යත්, අප ඒවා දරුවන්ට ආදරය පෙන්වීමේ එක් මාර්ගයක් ලෙසද වරදවා වටහාගෙන ඇත".

මේ අනුව බලන කළ 'ළමා අයිතිවාසිකම් පිළිබදව පුනරුදය' බටහිරින් උපන් නූතන මතවාදය නොවේ. ඊට මුල්වූ පුරෝගාමීන් කොතෙකුත් අප ඉතිහාසය පුරාම සිට බව ඉදුරාම සත්‍යය එහෙයින්ම දරුවන් විෂයෙහි කෙරෙන සියළුම ආකාරයේ කායික හා මානසික දණ්ඩනයන්ට නැවතීම ලකුණ තැබීමටත්, දරුවන් හික්මවීම උදෙසා වඩාත් මානව හිතවාදී වූ ක්‍රියාමාර්ග අනුගමන කිරීමටත්, අප කාගේත් අවධානය දැඩිව යොමුවිය යුතුය. සැබවින්ම එය ජාතික අවශ්‍යතාව මානව අත්‍යවශ්‍යතාවකි.

Law
Legal unit
340 LAM

# ළමා කායික දණ්ඩනය සැබවින්ම අවශ්‍යද ?

Please
DO NOT REMOVE
FROM LIBRARY



R
340
LAM
340
SIL

**මහාචාර්ය ඩී. ජී. හරේන්ද්‍ර ද සිල්වා, සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.**
**පියංජලී ද සොයිසා, සායනික මනෝ විද්‍යා කථිකාචාර්ය, - වෛද්‍ය පීඨය, කොළඹ.**
**නයෝමි කන්නන්ගර, මනෝ විද්‍යාඥ, - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.**

NATIONAL CHILD PROTECTION AUTHORITY SRI LANKA ★ LIBRARY ★
Date 08/12/2009

LIBRARY
NATIONAL CHILD PROTECTION AUTHORITY
No: 330, Thalawathugoda Road,
Madiwela, Kotte.
Sri lanka

ACC NO 000577
CLASS NO 340 ~~LAM~~ SIL

## ප්‍රණාමය

දරු පරපුරේ මතු දවසේ සුරක්‍ෂාව වෙනුවෙන්ම ලියැවුණු මෙම කෘතියේ පිටු හා අකුරු නිර්මාණ ඇතුළු තාක්‍ෂණික වැඩ කොටසට උරදුන් සීමා සහිත තෝන් හෝල්ඩිංන්ස් පුද්ගලික සමාගමටත් විචිත්‍රවත් ලෙස චිත්‍ර නිර්මාණය කල ජයමිණි ද සිල්වාටත් අපගේ ප්‍රණාමය පුදමු. ඉංග්‍රීසි බසින් ලියවුණු මෙම කෘතිය මනාව සිංහලට පරිවර්තනය කරදුන් දාගොන්නේ ජයසිංහ විජයරත්න මහතාට සහ ජාතික ළමා ආරක්‍ෂක අධිකාරියේ මාධ්‍ය නිළධාරී සමනොළ මියුරු විජයරත්න මහතාට ද ස්තුතිය පුද කරමු. මෙම ග්‍රන්ථය සම්පාදනය සඳහා මිළ කළ නොහැකි තරම් වටිනා අදහස් සැපයූ "EPOCH-WORLDWIDE" ජාත්‍යන්තර සංවිධානයටත්, ඉතිහාසය පිළිබඳ අනර්ඝ මූලාශ්‍ර සපයා දුන් "Somewhere a child is crying " ග්‍රන්ථයේ කර්තෘවරයා වූ අභාවප්‍රාප්ත ඩොනවන් මෝල්ඩ්රිච් මහතාටත් අපගේ ගෞරවනීය ප්‍රණාමය පුදකර සිටිමු.

උපරිම සිල්ලර මිල රු 25/- ක් පමණි.

ළමයින් වෙත ආදරය, කරුණාව දක්වා හා විශ්වාසවන්නතව සිටින ගුරුවරුන් හට දරුවෝ වඩාත් හොඳින් සවන් දෙති. ඒ නිසාම වඩා හොඳින් හැසිරෙති. ළමයාට සමීප විය හැකි විශ්වාසවන්ත ගුරුවරු ළමයින්ට ආදර්ශයක් වෙති. එවැනි ගුරුවරුන් සිටින පංතිකාමර තුළදී වැරදි වැඩක යෙදීමට සිසුහු මැලිවෙති. මෙම ක්‍රියාවලිය ළමයින් තුල යහපත් හැසිරීම් රටා ඇති කිරීමට මූලික වන බව අවධාරණය කල යුතුය.

"ගුරුවරයෙකු යනු හුදෙක් බුද්ධිමය හා තාක්‍ෂණික දැනුම බෙදා හරින්නෙකු නොවේ. ඔහු/ඇය අප සමාජයේ හරයන් සමාජ ධර්මයන් විශ්වාසයන් හා හැසිරීම් රටාවන් පරපුරෙන් පරපුරට ලබා දෙන්නකු වේ".

-බී. ආර්. විල්සන්, 1962 -

## උපදේශන සේවය ගැන වදනක්........

මූලික උපදේශන පාඨමාලා හදාර ඇති ඇතැම් ගුරුවරු පාලනය කිරීමට අපහසු සිසුන් සමග කටයුතු කිරීමේදී එම දැනුම උපකාර කර ගනිති. ඉගැන්වීමේ කාර්යය තුළදී ගුරුවරයෙකු ඉටුකරන වගකීම් සම්භාරය ගැන සලකා බැලීමේදී උපදේශකයකු වශයෙන් කටුයතු කිරීම එතරම් පහසු කටයුත්තක්ද නොවන බව පෙනේ. එහෙයින වඩාත් ප්‍රතිඵලදායක වන්නේ උපදේශකයකු පූර්ණ හෝ අර්ධ කාලීනව පාසල තුල සිටීමයි. එවිට හැසිරීම් හා ආකල්පමය ගැටළු පවතින සිසුන්ට පමණක් නොව පවුලේ අයෙකු අසාධ්‍ය ලෙස රෝගයකින් පෙලීම, පවුලේ අයකු මියයාම වැනි විවිධ හේතු නිසා මානසිකව පීඩා විදින දරුවන්ටද උපදේශන සේවාව ලබාගැනීමට හැකිය. මෙම දරුවන්ගේ මානසික පීඩාවන්ට සහනය ලබා දීමේ ප්‍රතිඵල පුද්ගලිකව එම ළමුන්ට පමණක් හිමිවන්නක් නොවේ. එය පොදුවේ සමස්ත පාසලටම අත්වන ප්‍රතිලාභයකි.



නිර්මාණ අනුග්‍රහය : සී/ස තෝන් හෝල්ඩිංගස් (පුද්ගලික) සමාගම.
රූ රටා : ජයමණී ද සිල්වා.
පරිගනක රූ සැකසුම : වසන්ත ශ්‍රී ලාල් ද සොයිසා


000577

ගුරුවරයෙකු පංතිය තුල නොමැති වේලාවන්හීදී සිසුන් වෙතින් පූර්ණ නිශ්ශබ්දතාවක් හා නිශ්චලතාවක් බලාපොරොත්තු නොවන්න. ඒ වෙනුවට අනිත් සිසුනට බාධා නොවන අයුරින් හැසිරීමටත් (ශබ්ද පහත් කොට කතා කිරීමට, එක් තැනක හිද කල හැකි වැඩක් කිරීමට) අන් අයගේ සතුටට බාධා නොකර සතුටු වීමටත් දරුවන්ට කියා දෙන්න.

**දරුවන්ගේ වයස් මට්ටම සැලකිල්ලට ගන්න.** ඒ අනුව විනය පාලන විධික්‍රම තීරණය කරන්න. විවිධ වයස් මට්ටම් වල දරුවන් විවිධ හැසිරීම් රටා හා අවශ්‍යතාවන්ගෙන් යුක්තය. දරුවාගේ බුද්ධි හා වර්ධන මට්ටම් තේරුම් ගෙන කුමන පාලන ක්‍රම වඩා යෝග්‍ය හා ඵලදායී වේද යන්න තීරණය කරන්න.

කුඩා දරුවෙකු වෙතින් යම් වරදක් සිදු වු විට එය සිදු වු විගසම වරද නිවැරදි කිරීම සිදුවිය යුතුය. එසේ නොකර පැය හෝ දින ගණනකට පසු සිදුවන නිවැරදි කිරීමක් වරද හා ගලපා ගැනීමට දරුවාට නොහැකි වීමට හැකිය. (මේ නිවැරදි කරන්නේ කුමන වරදදැයි වටහා ගැනීමට දරුවාට අපහසු වනු ඇත.) නිතරම කෙටි හා පැහැදිලි හේතු කුඩා දරුවන්ට දෙන්න. දරුවන් වයසින් වැඩෙත්ම උපදේශාත්මක සාකච්ඡා හා අවවාද වැඩි වශයෙන් භාවිතා කල හැකිය.

**අත්වැරදීම් හා අතපසුවීම් වලට දඩුවම් නොකරන්න.** අත්වැරදීම් වලට දඩුවම් ලැබෙන බව දන්නා විට භයානක හා හානිදායක අවස්ථාවලදී පවා වැඩිහිටියන්ගෙන් උදව් ඉල්ලීමට දරුවෝ මැලිවෙති. අත්වැරදීම් හා අතපසුවීම් කා අතිනුත් සිදුවේ. සිදුවූ වැරදි නිවැරදි කර ගන්නා ආකාරයත් අනාගතයේදී නැවත සිදුවීම් වලක්වා ගන්නා ආකාරයත් දරුවන්ට කියාදෙන්න.



- **අවබෝධයෙන් නිවැරදි වන්නට දරුවාට අවස්ථාවක් දෙන්න.** දරුවා තමා වරදක් කරන බව නොදැන වැරදි ක්‍රියාවක යෙදී ඇත්නම් වරද පැහැදිලි කොට, එය නිවැරදි කර ගැනීමට අවස්ථාව දරුවාට දෙන්න.
  දරුවකු වරදක් බව නොදැන පාසල් වත්තෙන් පංති කාමරය සදහා මල් කඩාගෙන ඇත්නම්, එය එසේ නොකල යුතු දෙයක් බව දරුවාට පැහැදිලි කරන්න. මෙවැනි අවස්ථාවක දඩුවම් කරනවාට වඩා අවවාද කිරීම ප්‍රතිඵලදායකය.

- **දරුවකු අතින් සිදුවූ වැරදි නැවත නැවත මතක් නොකරන්න.** කිසිම දරුවකු නරක දරුවකු ලෙස නම් නොකරන්න. බොහෝ දරුවන් වැරදි තුලින් නිවැරදි දෙය විය යුත්තේ කුමක්දැයි ඉගෙන ගන්නා බව මතක තබා ගන්න. ඔවුන්ගේ ඒ වර්ධන ක්‍රියාදාමය වටහාගෙන එයට සහය වන්න.

- **දරුවන් නිවැරදි කිරීමේදී ඔබට දඩුවම් පමුණුවා නොගන්න.** දරුවන් ඉදිරියේ කෝපවීමෙන්, කෑගැසීමෙන් තොරව විනීතව, පාලනයක් සහිතව හැසිරෙන්න. තරහව, කෝපයට වඩා හික්මවීමේදී ආදරය හා කරුණාව වඩා බලවත් බව සිහිතබා ගන්න.

NATIONAL CHILD PROTECTION AUTHORITY SRI LANKA ★ LIBRARY ★
Date 08/12/2009
LIBRARY
NATIONAL CHILD PROT... AUTHOR...
No: 330, Thalawath...
Madiwela, Kotte.
Sri lanka



Reference Only

සමාජ ප්‍රචණ්ඩත්වය යන්න ශ්‍රී ලංකාවේ දැන් නිතර කියවෙන මාතෘකාවකි. එහි මූලාරම්භය කොතැනද? නිරන්නතරයෙන්ම රටක යුධ අරගල පැවතීම සමාජ ප්‍රචණ්ඩත්වයන් ඇතිවීමට ප්‍රධාන සාධකය බැව් පර්යේෂණ හෙළිකරයි. පාසලේදී හෝ ගෙදර දොරේ දී ඇතිවන පවුලේ ආරවුල් ද මත්පැන් හා මත්ද්‍රව්‍ය හේතුකොට ගෙන ඇතිවන විවිධ සමාජයීය තත්ත්වයන් ද කායික දඩුවම් හා ප්‍රචණ්ඩත්වය රැගත් ජනමාධ්‍යයන්ට දරුවන් නිරාවරණය වීමද ඊට බලපාන තවත් ප්‍රධාන හේතූන් යැයි හදුනාගෙන ඇත. සමාජය තුළ පවතින ඉහත සාධක පිළිබදව සලකා බැලීමේදී සමාජ ප්‍රචණ්ඩත්වයක් උද්ගතවීම පුදුමයට කරුණක් නොවේ.

ලොව බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවද සියළුම කායික හා මානසික ප්‍රචණ්ඩත්වයන්ගෙන් දරුවන් ආරක්ෂා කිරීම සදහා බැදී සිටියි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට එක් වෙමින් පාසල් වල විනය කටයුතු හැසිරවීමේදී දරුවන්ගේ ගෞරවය සුරැකෙන පරිදි ක්‍රියාකිරීමට බැඳී සිටින බවට 28 (2) වගන්තිය යටතේ ශ්‍රී ලංකාව පොරොන්දු වී ඇති බව අමතක කළ යුතු නැත.

## කායික දඩුවම් අප සංස්කෘතියට ආවේණික උරුමයක්ද?

පැරණි සිංහල රජවරුන් වරදකරුවන්ට විවිධ වද හිංසා පැනවූ බවට සාක්ෂ්‍ය ඇතත්, දරුවන්ට වදහිංසා පැනවූ බවට සාක්ෂ්‍ය ඇත්තේ ඉතා අල්ප වශයෙනි. **වෝහාරික තිස්ස රජු** කායික දඩුවම් ඉවත් කිරීමට නීති රීති පනවා තිබූ බවත් **දෙවන විජයබාහු රජු** කාරුණිකත්වයට මුල් තැන දී කටයුතු කළ බවත්, **තුන් වන විජයබාහු රජු** ඔහුගේ කාරුණිකත්වය විශේෂයෙන්ම දරුවන් වෙත යොමු කල බවත් ඉතිහාසයේ සදහන් වේ.

ශ්‍රී ලංකා ඉතිහාසය පුරා කායික දඩුවම් ඉතා අල්ප වශයෙන් දැකිය හැක්කේ පිරිවෙන් අධ්‍යාපනය හා බෞද්ධ භික්ෂූන්ගේ මාර්ගෝපදේශනයෙන් ලත් පෝෂණය තුළිනැයි පෙනේ. සියළු සත්ත්වයෝ දණ්ඩනයට බිය වෙතැයි ද, එහෙයින්ම තමා උපමාවට ගෙන අනුන්ට හිංසා කිරීමෙන් වලකින ලෙසත් ධම්ම පදයේ සදහන්වේ. අප සංස්කෘතියේ වු බෞද්ධ සාරධර්ම මගින් සමාජය තුළ නිසගයෙන්ම ළමා ආරක්ෂාව තහවුරු කර තිබිණි. "දරුවකුගේ මනස දර පතුරක් මෙන් කපා කොටා යතුගා සකස් කල නොහැකිය. එය වැඩෙන්නට හැරිය යුත්තේ සාත්තු කොට පැලයක් වවන ආකාරයටය. එහෙයින් ගුරුවරයකුගේ කාර්යය සැබවින්ම වඩුවකුගේ කාර්යයට වඩා ගොවියෙකුගේ කාර්යයට සමානය." යනුවෙන් ස්වාමි විවේකානන්ද පවසා ඇත. අතීත ශ්‍රී ලංකාව එසේ තිබෙන වකවානුවේ සමකාලීන යුරෝපයේ පාසල්වල කායික දඩුවම් යන්න කවුරුත් යොදාගත් ඉතාම සාමාන්‍ය දෙයක් වී තිබිණි. එනිසාම මෙරට පැමිණි විදේශිකයන් මෙරට පාසල් වලද, විශේෂයෙන්ම ප්‍රධාන නගර වල පිහිටි පාසල් වල කායික දඩුවම් ක්‍රියාත්මක කිරීම අරඹන්නට ඇතැයි අනුමාන කල හැකිය.

කායිකව දඩුවම් දීම වරදකාරී වැඩිහිටියකුට වුවද සුදුසු නොවන්නක් යැයි පොදුවේ පිළිගන්නා අදහසකි. එසේ තිබියදීත් පාසලේදී හඩනගා කතා කිරීම, වැඩිහිටියෙකුගෙන් නොවිමසා රස කැවිල්ලක රස බැලීම, බොරු කීම, වැනි අවස්ථාවන්හිදී දරුවා ඊට පෙළඹුනේ ඇයිද යන්න පිළිබඳව දරුවා සමග විවෘතව කතා කොට, වරද පිළිබදව නියම ආකාරයෙන් දරුවාට අවබෝධකර නොදී, ආවේගශීලිවී, දරුවකුට තැලීම යුක්ති සහගතදැයි සිතා බැලිය යුතුය. බොහෝ විට දරුවන් බොරුකීමට පෙලඹෙන්නේත් දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ මෙම හැසිරීමට දක්වන බිය නිසා බවද මතක තබා ගත යුතුය.




## දරුවන්ට කායික දඬුවම් පැමිණවීමෙන් වැලකිය යුත්තේ ඇයි?

කායික දඬුවම් පැමිණ වීම වේදනාව හා තුවාල ඇති කරයි. දරුවා ලැජ්ජාවට හා අවමානයට පත් කරයි. දරුවා තුල සාංකාව ද්වේෂය හා වෛරය මතු කරයි. මෙවැනි හැඟීම් පසු කාලීනව මානසික ගැටළු ඇතිකරවිය හැකිය. එනම් කායික දඬුවම් මගින් දරුවාට මානසිකවද වේදනාව හා තුවාල ඇති කරයි. එය වඩාත් බරපතලය.

බොහෝවිට ශාරීරිකව පමුණුවන වදහිංසා දරුවන් ප්‍රචණ්ඩත්වයට යොමු කරවීමට මුල්වන බව පෙනේ. කුඩා කල වදහිංසාවන්ට ගොදුරු වූවන් පසුකාලීනව තම අඩු දරුවන්ට ශාරීරිකව පීඩා පමුණුවන්නන් හෝ දිවි නසා ගැනීමට ප්‍රවනතාවයක් ඇති පුද්ගලයන් බවට හෝ ඒ දෙකම සිදුකරගන්නා වූ හෝ අය බවට පත්විය හැකිය.

සියළු සත්වයෝ දඬුවමට බිය වෙති;
සියල්ලෝම මරණයට බිය වෙති.
සියළු සත්වයෝම ජීවිතයට ආසා කරති.
එහෙයින් තමාව උපමාවට ගන්න.
එවිට ඔබට කුමන හිංසාවක් කා හට කළ හැකිද?
-ධම්ම පදය-

## දරුවන්ට තැලීම පිළිබඳ අප තුල ඇති සාවද්‍ය ආකල්ප



**✗ වැරදි**

දරුවකු හැදීමට (ගොඩනැගීමට) කායික දඬුවම් අත්‍යාවශ්‍ය. හොඳින් වැඩකිරීමට, නීති ගරුක වීමට, වැඩිහිටියන්ට සැලකීමට, වරදින් නිවැරදි දේ තෝරා ගැනීමට දරුවන් ඉගෙන ගන්නේ කෝටුපාර හා කම්මුල්පාර තුලිනි. කායික දඬුවම් නොකලහොත් දරුවන් විනයකින් තොර නරක දරුවන් බවට පත්වේ.

**✓ නිවැරදි**

දරුවන්ට විනය අවශ්‍යය. විශේෂයෙන්ම ඔවුන් ස්වයං විනය (තමා විසින් තමාවම පාලනය කර ගැනීම) උගත යුතුය. කායික දඬුවම විනය ගොඩනැගීමට ගන්නා ඵල රහිත ක්‍රියා මාර්ගයකි.කායික දඬුවම් ලද දරුවකුගෙන් තමා තැලීමට ලක්වූයේ මන්දැයි විමසුවහොත් වරදක් කල නිසා බවට පිළිතුරු ලැබුණද වරද හරිහැටි පැවසීමට දරුවාට බොහෝ විට නොහැකි වෙයි. පහරදීම, කෑගැසීම් හා හැඬීම් අතරින් ඔබ දඬුවමට දක්වන හේතු දරුවාට නොඇසීම හා නොවැටහීම මෙයට හේතුවයි. හිංසාවට හා අවමානයට ලක්වූ විට බොහෝ විට දරුවන් තුල කණගාටුවකට වඩා ඇතිවනුයේ වෛරයකි



## දිගු ගමනක මුල් පියවර.......

- **සාධාරණ සීමා නියම කරන්න. වඩා උස් වූ හෝ වඩා පහත් වූ සීමාවන්ගේ ඵලදායීතාව අඩුය.**

✗ වැරදි "මට මේ පංතිය පැත්තෙන් "හ්ම්" සද්දයක් ඇහුනොත් බලාගෙනයි!"

✓ නිවැරදි "මම උගන්වන අතරේ කිසි කෙනෙකුට කතා කරන්න බැහැ මට කතා කරන්න ඕනේ නම් අත උස්සන්න. මම කතා කරන්න දෙන්නම්."

- **සීමාවන් හොඳින් පැහැදිලි කරන්න.**



✗ වැරදි "මම ඔයගොල්ලන්ගේ අලුත් ගණිත ගුරුවරයා. මාත් එක්ක සෙල්ලම් කරන්න ලැහැස්ති වෙන්න එපා!"

✓ නිවැරදි "මම ඔයගොල්ලන්ගේ අලුත් ගණිත ගුරුවරයා. මගේ පංතිය වෙලාවේදී මම ඔයගොල්ලන්ගෙන් බලාපොරොත්තුවන දේවල් මම දැන් කළු ලෑල්ලේ ලියනවා එතකොට වැඩ කෙරෙන්නේ කොහොමද කියලා හැමෝටම පැහැදිලි වෙයි."

- **නොකල යුතු දෙය නොව කළයුතු දෙය පවසන්න.** වැරදි අදහස් වෙනුවට නිවැරදි අදහස් දරුවාට දෙන්න.

✗ "බිත්තිය කැත කරන්න එපා!"
✓ "බිත්තිය පිරිසුදුව තියා ගන්න!"
✗ "සද්ද කරන්න එපා!"
✓ "නිශ්ශබ්ද වෙන්න!"

- **එක් මතයක පිහිටා එක් ක්‍රියාවලියක් අනුගමනය කරන්න.** ප්‍රධාන විනය ගැටළු පිළිබඳව ගුරු හා ගුරු දෙගුරු රැස්වීම් වලදී සාකච්ඡා කරන්න. ඒවා සම්බන්ධයෙන් ගතයුතු පියවර පිළිබඳ ඒකමතික තීරණයකට එළඹෙන්න. විනය සම්බන්ධයෙන් සෑම ගුරුවරයෙකුම එක ලෙස ක්‍රියා කල යුතුය. ගත් තීරණ **සෑම දරුවකුටම** එක ලෙස බලපෑ යුතුය. විටින් විට වෙනස් වන තීරණ දරුවන් තුළ පැටළලි සහගත තත්ත්වයන් ඇති කල හැකිය.

- **අයහපත් හැසිරීම්වල ප්‍රතිඵල දරුවාට කලින්ම ඇනුම් දෙන්න.** වැඩිහිටියන්ට අවශ්‍යවනුයේ දරුවන් වැරදි ක්‍රියාවන්ගෙන් වැලැක්වීම් විනා දඬුවම් කිරීම නොවේ. තම වැරදි ක්‍රියාවන්ගේ ප්‍රතිඵල මොනවාදැයි කලින්ම දැනගැනීමෙන් කරන්න පෙර සිතාබලන ස්වයං පාලනයක යෙදෙන්නට දරුවන්ට අවස්ථාව ලැබේ.

✓ නිවැරදි 'මම දෙන ගෙදර වැඩ සෑම ළමයෙක්ම අනිවාර්යයෙන්ම කල යුතුයි. සැලකිය හැකි හේතුවක් නැතිව යම් ළමයෙක් වැඩ නොකරගෙන ආවොත් ඊලඟ දවසෙදි වැඩිපුර පැවරුම් කරන්නටත්,මා ගෙදර වැඩ නොකලේ ඇයි? යන මාතෘකාවෙන් රචනාවක් ලියන්නත් සිදු වේවි.'

- **ප්‍රායෝගිකව සිතන්න.** ක්‍රියාත්මක කල හැකි දඬුවම් නියම කරන්න. ඔබ වගකීමක් සහිතව ප්‍රකාශයන් කරන බව දරුවන්ට ඒත්තු ගන්වන්න.

- **ඔබේ ප්‍රකාශ ක්‍රියාත්මක කරන්න.** කියන දේ කරන්නෙකු බවට පත්වන්න.

- **දරුවන් වෙතින් ඓශ්වර්යයන් බලාපොරොත්තු නොවන්න.** ඔවුනට කල හැකි හා නොහැකි දේ පිළිබදව වටහා ගන්න.

## දරුවකු විනයෙන් හා ඉගෙනීමෙන් පසු බසින විට................

### ප්‍රශ්නයට හේතුව කුමක්දැයි සොයා බලන්න.




මෙය ඉතාම වැදගත් කර්යයකි. දරුවකු සමග ඔහුගේ/ඇයගේ හැසිරීම් රටාවට හේතු සාකච්ඡා කරන විට අප දරුවා පිළිබදව මුලින් ගොඩනගා ගෙන සිටි ප්‍රතිරූපය සම්පූර්ණයෙන්ම වැරදි බව බොහෝ විට හැගීයයි. ඔහු පාඩම අතරතුර නිදාවැටීමට හේතුව කුමක්ද? ඒ රෑ ඔහු බඩගින්නේ සිටින නිසා විය හැකිද? නැතහොත් එය ඔහුට නිවසේදී සියළු සහෝදර සහෝදරියන් සමග එක් ඇඳක අපහසුවෙන් නිදාගැනීමට සිදුවූ නිසා වුවක්ද?, එසේ නැතහොත් රාත්‍රිය පුරා දෙමාපියන් දබර වූ නිසා සිදු වුවක්ද? ඔහුගේ නිදිකිරා වැටීමට හේතුව මෙවැන්නක් නම් පන්තිය ඉදිරියේ දරුවා අවමානයට හා ලජ්ජාවට පත්කිරීමෙන් කවර ප්‍රයෝජනයක් ද? දරුවාට වේවැලෙන් පහර දීමෙන් හෝ පැය ගණන් අව්වේ සිටුවා තැබීමෙන් ප්‍රතිඵලයක් ලැබේද?

### දරුවා සමග සාකච්ඡා කරන්න.

ගුරුවරයකු හෝ ශිෂ්‍ය උපදේශකයෙකු විසින් දරුවා ගේ හැසිරීමේ ප්‍රශ්නය පිළිබදව ඔහු/ඇය සමග කතා කිරීම ඉතාම වැදගත් වේ. දරුවා සමග සාකච්ඡා කරන පුද්ගලයා දරුවාට සමීප විය හැකි, දරුවා තේරුම් ගත හැකි, විශ්වාසවන්ත හා කරුණාවන්ත පුද්ගලයෙකු විය යුතුය. මෙවැනි පුද්ගලයෙකු, අන්‍යයන් තමා පිළිබදව ගරු සැලකිල්ලක් දක්වන බවට දරුවාට ඒත්තු ගන්වන අතර එහි ප්‍රතිඵල ලෙස තමා ගැටළුව විවෘතව සාකච්ඡා කිරීමට පොළඹවයි. දරුවා වෙතින් ලබා ගන්නා එම තොරතුරු දරුවා තුළ පවත්නා හැසිරීමේ හා ඉගනීමේ ගැටළු මග හරවා ගැනීමට ඉවහල්වේ.

### දරුවාගේ දෙමාපියන් සමග සාකච්ඡා කරන්න.

දෙමාපියන් සමග සාකච්ඡා කිරීම අනිවාර්ය ප්‍රතිඵල ගෙන දෙන්නකි. දරුවාගේ සෑම ගැටලු සහගත හැසිරීමක් පිළිබදවම දෙමාපියන් සමග සාකච්ඡා කිරීම අවශ්‍ය නොවේ. එහෙත් ඔබ උත්සාහ කරනුයේ දරුවා, දෙමාපියන්, පාසල වැනි වූ සියළු ප්‍රධාන පාර්ශව අතර සහයෝගී සම්බන්ධතාවක් ඇති කොට එතුලින් දරුවාගේ සුබසිද්ධිය තහවුරු කරවීමට බව දෙමාපියන්ට පැහැදිලි කර දිය යුතුය.






මදක් සිතන්න. කම්මුල් පහරකින් පල කෙරෙනුයේ ඔබට කේන්තිගොස් ඇතිබව විනා, ඔබට කේන්ති ගොස් ඇත්තේ ඇයිද යන්න නොවේ. එසේම වරදින් වැලකී සිටීම හා නිවැරදිව හැසීරීම වෙනුවෙන් දරුවන්ට ප්‍රශංසා නොකිරීමද වැඩිහිටියන් අතින් සිදුවන තවත් වරදකි.



නිවසක් හෝ පංතිකාමරයක් ගතහොත් එකම වරදට නිතර නිතර දඬුවම් ලබන දරුවන් දැකිය හැකිය. තැලීම නිසා වරද නිවැරදි වේ නම් මෙය මෙසේ සිදු විය යුතු නොවේ. නිතර කායිකව දඬුවම් ලබන දරුවන් ටික කලකින් ඊට ප්‍රතිරෝධයක් ගොඩනගා ගන්නා අතරම පහර කෑම හිනාවට, විහිළුවට කරුණක් බවට පත්කර ගනී. එසේම එවැනි දරුවෝ සිය මිතුරන්, සමකාලීනයන් අතර "චණ්ඩීන්" "තදයන්" ලෙස පිළිගැනීමට ලක්වීම හේතුවෙන් වඩ වඩාත් වැරදි කිරීමට පෙළඹෙති දරුවකු වරදක් කලවිට ගුරුවරුන් බොහෝ විට කෝපයට පත්වීම හා කලබලයට පත්වීම අනිත ළමයින්ට විනෝදජනක දෙයක් බවට පෙරලීම මෙම තත්ත්වය වඩාත් බරපතල කරවයි.

එසේම සාමාන්‍යයෙන් හොදින් හැසිරෙන දරුවකුට පහරදීමක් හෝ අවමානයක් සිදුකල විට එය දිගු කාලීන අහිතකර ප්‍රතිඵල ඇතිකරවන කම්පනයක් බවට පත්විය හැක. එසේ කම්පනයට පත්වූ දරුවන් පාසල් යාම ප්‍රතික්ෂේප කිරීමට හැකිය. මෙවැනි කම්පනයක් දඬුවම් ලැබීමෙන් පමණක් නොව අන් දරුවන් දඬුවම් ලබනවා දැකීමෙන්ද සිදුවිය හැක.





✗ වැරදි

"දරුවකු ලෙස මා කායික දඬුවම් ලැබුවත් ඉන් මට හානියක් වී නැත. අද මා සිටින තැනට මා පැමිණ ඇත්තේ ගුරුවරුන් හා දෙගුරුන් මට තැලු නිසයි." **කායික දඬුවම් නොලැබුවත් ඔබ අද සිටින තත්ත්වයට හෝ ඇතැම් විට ඊටත් වඩා ඉහළ තත්වයකට** පැමිණෙනවා ඇත. **පහරදීම් වැනි දැඩි කායික දඬුවම් නිසා වරදට යොමු වූ අයාලයේ ගිය දරුවන් පිළිබදව ඔබ සිතා බැලුවාද?**

**පාලන රීතීන්ගේ නවීකරණයට හා වෙනස්කම් වලට විශාල ප්‍රතිරෝධයක් දක්වන්නේ ළමා වියේ කායික දඬුවම් ලැබූ අය හා දරුවන්ට පහරදෙන අය බව පර්යේෂණ හෙළි කරයි.**

සමහර විට එය එසේ වන්නේ,



අප අතරින් වැඩි දෙනෙක් දෙමාපියන්ට හා ගුරුවරුන්ට ආදරය කරති. අපට ඔවුන් හා බැඳුණු අත්දැකීම් ප්‍රීතිදායකය. ඔවුන් අපට ආදරය කල අතර අපිද ඔවුනට ආදරය කරමු. එම නිසාම ඔවුන් අපට තැලූ අවස්ථා පිළිබඳ අමිහිරි මතකයන් අප වෙත ඇතත් අපි ඔවුන් පිළිබඳව අසුභවාදිව කතා කිරීමට මැලිවෙමු. මදක් සිතන්න. අප කායික දඬුවමට පටහැනිව කතා කිරීම, ක්‍රියා කිරීම, අපට කායික දඬුවම් පැමිණ වූ එහෙත් අප ආදරයෙන් සිහිපත් කරන පුද්ගලයන්ට විරුද්ධව යාමක්ද? අපේ අනාගත පරපුරෙහි සුභසිද්ධිය කෙරෙහි බලපාන කරුණක් සාකච්ඡා කිරීමට එවැනි හේතු මත අප මැලිවිය යුතුද?
එලෙසම අතීතයේ තම දරුවන්ට හෝ ශිෂ්‍යයන්ට කායික දඬුවම් පැමිණවූ හෝ තවමත් එසේ කරන අය තමා කෙරෙහිම ඇතිවන ලජ්ජාව හා වරදකාරී බව වසා ගැනුමට තම ක්‍රියාවන් නිවැරදි බවට තර්ක ද ඉදිරිපත් කරති.

**එහෙත් අප තවම ප්‍රමාද නැත.**

දරුවන්ට හෝ ශිෂ්‍යයන්ට කායික දඬුවම් පමුණුවන බොහෝ දෙනෙකු එසේ කරනුයේ පාරම්පරිකව ලද අභ්‍යාසයක්, පුරුද්දක් නිසා විය හැකිය. කායික දඬුවමෙන් ඇතිවන අයහපත් ප්‍රතිඵල ගැන අවබෝධ කර ගත් විට බොහෝ දෙනා ඉන් වැලකෙති. සිදුවූ වැරදි ගැන පසු තැවිය යුතු නොවේ. කායික දඬුවම් පැමිණවීම පිළිබඳව අප මුතුන්මිත්තන්ටද දොස් නැගිය නොහැකිය. ඊට හේතුව එම කාලයේදී වඩා ප්‍රතිඵලදායකයැයි සිතූ පාලන ක්‍රමයක් ලෙස ඔවුන් විසින් එය අනුගමනය කල නිසාවෙනි. එසේ වුවත් කායික දඬුවමේ ඵල විපාකයන් පිළිබඳ ඇති තතු දැන දැනත් එයින් නොගැලවෙන්නේ නම්, ඔබ නිසැකවම වරදකරුවෙකි.

❌ වැරදි

දරුවන් යනු දෙමාපියන්ගේ අයිතියකි. එහෙයින් තමාට සුදුසු යැයි හැගෙන අයුරකින් දරුවන්ට දඬුවම් කිරීමට දෙමාපියන්ට අයිතිවාසිකමක් ඇත.


✔ නිවැරදි

මෙලොවට දරුවන් බිහිකරන්නේ දෙමාපියන් වුවද, දෙමාපියන්, ගුරුවරුන් හෝ වෙනත් අයෙකු විසින් පමුණුවන කායික හා මානසික හිංසාවන්ගෙන් සුරැකීමේ අයිතිය දරුවන්ට ඇත. ශ්‍රී ලංකාවද අත්සන් තබා ඇති එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මෙන්ම, 1995 දී සංශෝධිත අපරාධ නීති සංග්‍රහයට ද අනුව සෑම වැඩිහිටියෙකුට මෙන්ම, සෑම ළමයෙකුටම ද තනි පුද්ගලයෙකුට මෙන් සැලකීමද, ගෞරවය හා නීතියෙන් ආරක්ෂාව ලබා දීමද සිදුවිය යුතුය.





## දරුවකු වර්ධන අසාමාන්‍යතාවකින් පෙලෙන්නේ යැයි සැක පහල වූ විට කුමක් කල හැකිද?



- නිතර සිදුකරන කායික දඬුවම් හා දෝෂාරෝපණයද, ළමයා පහත් කොට කතා කිරීම වැනි මානසික දඬුවම් ද හේතු කොටගෙන තමන් පිළිබඳ අවතක්සේරුවක්, හීනමානයක්, මානසික අවපාත තත්ත්වයක් හා සමහර විට තරහව, සාංකාව වැනි තත්ත්වයන්ද දරුවා තුල ඇතිවිය හැකිය. ළමා වියේදී සිදුවන මෙවැනි මානසික ආපදාවන්ගේ අයහපත් ප්‍රතිඵල ළමා වියෙන් පසුවද එම පුද්ගලයාට පමණක් නොව ඔහු/ඇය වටා සිටින අනෙක් පුද්ගලයන්දට ද එකසේ විදීමට සිදුවෙයි.


- මෙම අසාමාන්‍යතාවන් නිසා හටගත් රෝග ලක්ෂණ මතුවූ විට දරුවා කායික හා මානසික වෛද්‍යවරුන්ගේ අවධානයට යොමුකල යුතුය. නිවැරදි ප්‍රතිකර්ම තුලින් අසාමාන්‍යතාවන්ගේ ප්‍රධාන ලක්ෂණ මගහරවා ගත හැකිය.

- එමගින් එවැනි දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නංවා ගත හැකි බවටද සාක්ෂ්‍ය ඇත. අසාමාන්‍යතාවන් පිළිබඳ නිවැරදිව අවබෝධ කොට ගෙන පාසලෙන් ලබා දෙන සහයෝගය මෙවැනි දරුවන්ගේ අනාගතය කෙරෙහි විශාල වශයෙන් බලපායි.

**පාසල තුළ විනය පිරිහීමට බලපාන වෙනත් කරුණු:**

- අයහපත් සෞඛ්‍ය තත්ත්වය, මන්ද පෝෂණය, ශ්‍රව්‍ය දෘෂ්‍ය ආබාධ වැනි දෑ හේතුවෙන්, දරුවන් තුල පාසල් වැඩට ඇති ශක්තිය හා උනන්දුව හීන කරවයි. මෙය දරුවාගේ අකීකරු කම්මැලිකමක් ලෙස වරදවා වටහා ගත යුතු නොවේ.
- සමහර දරුවන්ට අධ්‍යාපනයේ වටිනාකම හා අධ්‍යාපනය ලැබිය යුත්තේ ඇයි? ද යන්න පිළිබඳව නිසි අවබෝධයක් නොතිබිය හැකියි.
- තමාගේ ඉගෙනීමේ නොහැකියාවන් වෙතින් අවධානය වෙනතකට යොමුකරවීමට සමහර දරුවන් පංතිය හා පාසල තුල ඉගනීමට බාධා කරනවා විය හැකිය.
- ගුරුවරුන්ට, පාසලට හා ඉගෙනීමට ගෞරවයක් නොමැතිකම
- පාසල් දේපල පිළිබඳව ගෞරවයක් නොමැති වීම.
  නිදසුන් : පාසල් දේපල විනාශ කිරීම, විකෘති කිරීම.
- පාසල හා ඉගෙනීම සම්බන්ධව ශිෂ්‍ය කණ්ඩායමේ තුල ඇති පහත් ආකල්ප, ශිෂ්‍යයන් තුල ඉගෙනුමට ඇති උනන්දුව අඩු කරනවාද විය හැකිය.
- තමාගේ සුබසිද්ධිය හා ශිෂ්‍ය කණ්ඩායම් සතුටු කරවීම අතරින් වඩා වැදගත් වන්නේ කුමක්දැයි තෝරා ගැනීමට සිසුනට ඇති අපහසුතාවද එක් හේතුවක් විය හැකියි.
- පාසලෙන් හා අධ්‍යාපනයෙන් පරිබාහිර ක්‍රියාකාරකම් පාසල් වැඩ අතපසු කිරීමට ප්‍රධාන හේතුවක් විය හැකිය..

## ඉගෙනීමේ අසාමාන්‍යතා
## *(Learning disorders)*



අධ්‍යාපනය හා එයින් ලබන ජයග්‍රහණ අප සමාජය තුල ඉතා ඉහළින් අගය කෙරේ. දරුවන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ වැඩිහටියන්ගේ දරුවන් වැඩීමට හා ඔවුනට ඉගැන්වීමට ඇති දක්ෂතාවයේ හා හැකියාවේ සලකුණක් ලෙසද සැලකේ. මෙසේ මා පියෝ සහ ගුරුවරු දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල වශයෙන් වැයකරනු ලබන කාලය, ධනය හා ශ්‍රමයට හිලව් ලෙස අතිශය බුද්ධිමත් දරුවෙකුගෙන් බලාපොරොත්තු වන ආකාරයේ දස්කම් විස්කම් සිය දරුවන්ගෙන් බලාපොරොත්තු වෙති. එමෙන්ම එවැනි දෑ නොපෙන්වීම විශාල ගැටළුවක් බවට පත්වේ. මෙම අදක්ෂතාවයන් වක්‍රාකාරයෙන් වැඩිහිටියන් තමන් හොඳ ගුරුවරුන් හා දෙමාපියන් වශයෙන් තබාගන්නා ප්‍රතිරූපයට හානිකිරීම ඊට හේතුවයි එබැවින් ඔවුහු එකී අසාමාර්ථ්‍යයන්ගේ වරද දරුවන් මතම පැටවීමට අවිඥානිකවම පෙළෙඹෙති. ඒ අනුව වැඩිහිටියෝ එකී අසාමාර්ථ්‍යයන්ට මුල් වූ හේතු බීජ සොයති. දරුවාගේ කම්මැලිකම, උනන්දුවක් නැතිකම වැනි දෑ ඊට හේතුලෙස දකිති. ඉන් දරුවා ගලවාගැනීම පිණිස දැවැන්ත මෙහෙයුමක් අරඹන්නේ ඉන්පසුවය. තරවටු කිරීම. ශාරීරික දඬුවම් දීම පෙරටු කොටගත් තදබල ඉගැන්වීමේ ක්‍රම යොදා ගැනීමට පෙලඹෙන්නේ ඒ සියල්ලේම ප්‍රතිඵලය ලෙසිනි.

එහෙත් දෙමාපියන් හා ගුරුවරුන් මෙතැනදී සිහිතබා ගත යුතු දෙයක් ඇත. එනම් දරුවකුට පාසල් වැඩ කරගෙන යැමට අපහසුනම් එය ඔහුගේ/ඇයගේ කම්මැලිකම හෝ නොසැලකිල්ල නිසා නොව ඊට පරිබාහිර වෙනත් හේතු නිසා ඇති වූවක් දැයි යන්න පිළිබදව හොඳින් සොයා බැලිය යුතු බවයි. එනම් ස්වභාවයෙන්ම ඔහු/ඇයගේ කියවීම හා ලිවීම වයස හා බුද්ධි මට්ටම අනුව තිබිය යුතු සාමාන්‍ය මට්ටමට වඩා බොහෝ පහල මට්ටමක පවතිනවා විය හැකිය. එනම් දරුවා "ඉගෙනීමේ අසාමාන්‍යතාවකින්" *(Learning Disorder)*පෙළෙනවා විය හැකිය.

ශ්‍රව්‍ය හෝ දෘෂ්‍ය අබාධයකින් තොරව, එම වයසේ ළමයෙකුගේ සාමාන්‍ය කියවීමේ හැකියාව හා දරුවාගේ කියවීමේ හැකියාව අතර සැලකිය යුතු වෙනසක් පවතින්නේ නම්, දරුවා "කියවීමේ අසාමාන්‍යතාවකින්" *(Reading Disorder)* පෙලෙනවා විය හැකිය. වචන උච්ඡාරණයට ඇති අපහසුතාව, සාමාන්‍ය භාෂා රීති භාවිතයට ඇති අපහසුතාව වැනි රෝග ලක්ෂණ සහිත "ඩිස්ලෙක්සියා" *(Dyslexia)* නම් වූ කියවීමේ අසාමාන්‍යතාව මීට එක් නිදසුනකි. එහෙත් ඩිස්ලෙක්සියා රෝගයෙන් පෙලෙන දරුවකු කියවීමට අපහසුතා පෙන්වුවද වයසට සරිලන බුද්ධිමට්ටමකින් යුක්ත වේ. එමගින් කියවීමට එතරම් දක්ෂ නොවන දරුවකුගෙන් ඔවුන්ව වෙන්ව හඳුනා ගත හැකිය.

මෙහිදී ළමයා තුළ ඇති ගතිලක්ෂණ ඔහු/ඇයගේ මෙම නොහැකියාවන්ට හේතු ලෙස දැක්වීමත්. කායික හා මානසික දඬුවම් තුළින් ළමයාට ඉගැන්වීමට උත්සාහ කිරීමත් බොහෝවිට සිදුවන්නකි. මෙවැනි තත්ත්වයන් මගින් දරුවාට පාසල අමිහිරි අත්දැකීමක් බවට පත්වීම නොවැළැක්විය හැක්කකි. එහි ප්‍රතිඵල පාසල් කාලයෙන් බොහෝ ඈතට විහිදීමටත් හැකිය.



✗ වැරදි

දරුවන්ට ඇති ආදරය නිසා ඔවුන්ගේ සුභසිද්ධිය තකා හෝ දරුවන් අනතුරින් වලක්වා ගැනීම පිණිස හෝ දෙමාපියෝ දරුවන්ට දඬුවම් කරති.

## වැඩිහිටියන් විසින් දරුවන්ට පහර දීමට පෙළෙඹෙන ප්‍රධාන හේතු හතරකි:

වැඩිහිටියෝ කලකිරීමට හා තරහවට පත්වූ විට දරුවන්ට පහර දෙති.

✓ නිවැරදි

ඔබ වෙහෙස වී ගෙදර පැමිණි විට, රැකියා ස්ථානයේ ගැටළු මතුවූ විට, ආර්ථික ප්‍රශ්න ඇති වූ විට හෝ සහකාරිය/සහකරු සමග ගැටළු ඇතිවූ විට ඉතා සුළු දෙයකට වුවද ඔබට කේන්ති යා හැකිය. එවිට සාමාන්‍ය කෙළිලොල් බවින් යුතු හැසිරීමක් හෝ තරමක හඬ නැගෙන හැසිරීමක් හෝ දරුවකුගේ ඉතා කුඩා වරදක් හෝ ඔබ තුල නුරුස්සන සුළු බවක් ඇති කිරීමට සමත් විය හැකිය. එවැනි විටෙක ඔබ දරුවකුට තැලීමෙන් ඔබේ අසහනයට යම් සහනයක් ලබාගත්තද එමගින් දරුවාට සිදුවූ බරපතල අසාධාරණය පිළිබඳව මොහොතකටවත් සිතුවාද?.

දරුවන් නිවැරදි කිරීම සඳහා වැඩිහිටියෝ දරුවන්ට පහරදෙති.

✗ වැරදි



දරුවකු දඟකාරවී වෙනත් දරුවකුට පහර දුන් විට විනය රැක ගැනීම සදහා ගුරුවරයා විසින් දරුවාට තැලීම සැබවින්ම සුදුසු ද? මදක් සිතා බලන්න. බොහෝ අවස්ථා වල මෙවැනි දඟ ළමයින් නිවසේදී ද කායිකව දඬුවම් ලබන, හෙළා දැකීමට ලක්වන දරුවන් විය හැකිය. දරුවකු විසින් දරුවකුට පහර දීමෙන් සිදු කර ඇති වරද නිවැරදි කරන්නට පෙරළා පහර දීමෙන් ඔබ දරුවාට ලබා දෙන පණිවුඩය කුමක් ද? කෙනෙකු වරදක් කලවිට එය පහර දීමකින් නිවැරදි කලහැකි බව ඔබ විසින් දරුවාට පවසනවා නොවේද? මෙවැනි පණිවිඩයක් ලැබෙන විට දරුවා අන් අයට පහර දීම නවතනු ලබයිද? පහර ලත් විගස දරුවා නිහඬ වුවද එය ඉතා සුළු කාලසීමාවකට පමණක් සීමා විය හැකිය.

එකට එක කිරීමක් හෙවත් පළිගැනීමක් ලෙස වැඩිහිටියෝ දරුවන්ට පහර දෙති.


✓ නිවැරදි

වයස අවු:10 ක දරුවෙකු විසින් ගුරුවරයෙකු පිළිබඳව "නරක" දෙයක් කී බව ගුරුවරයා දැනගත්තේ යැයි සිතමු. ඇතැම් විට දරුවා පවසා ඇත්තේ ඔහු/ඇය විසින් ඇසූ දෙයක් විය හැකිය. සමහරවිට තමාගේ ප්‍රකාශයේ තේරුමවත් ඔහු/ඇය නොදන්නවා විය හැකිය. එවැනි විටක ඔහු/ඇය සිය කාර්යාලයට කැඳවා "පාර සිටින්නට"" තැලීමෙන්, දණින් ඇවිද වීමෙන් හෝ පැය ගණනක් අව්වේ සිටුවා තැබීමෙන් පලක් වේද? මෙය පළිගැනීම පිළිබද නිදසුනකි.

වැඩිහිටියෝ දරුවන් අනතුරින් වලක්වා ගැනීමට දඩුවම් කරති.


❌ වැරදි

වාහන ගමන් කරන මාර්ගයක් වැනි අනතුරුදායක ස්ථානයකට ළමයා දිව යනු දුටුවහොත් ඔහු ඇය අල්ලා නවතාගෙන, අනතුර තේරුම් කර දිය යුතුයි. ඔහු/ඇය නැවැත්වීම සඳහා පහර දුනහොත් ඔහු/ඇය නැවැත්වීමට ප්‍රමාද විය හැකිය. පහර දීමෙන් මෙවැනි අවස්ථාවක ක්‍රියාකලයුතු ආකාරය පිළිබඳව දරුවා උගත යුතු පණිවුඩය නිවැරදිව නොලැබේ.



සත්‍යය නම් කායික දඩුවම් වල ප්‍රතිඵල රහිත බව නිසාම සුළුවෙන් ඇරඹෙන කායික දඩුවම් දරුවා වැඩෙත්ම, දරුණු දඩුවම් බවට පත් ව ප්‍රචණ්ඩත්වයට මග පාදයි.

"වෛරයෙන් වෛරය උපදී
මෛත්‍රියෙන් වෛරය සංසිදේ"
-ධම්මපදය-



"ඕම් මහාබ්‍රහ්මයා, ගුරු සිසු අප දෙදෙනාම රකිත්වා! උන්වහන්සේ අප දෙදෙනාම පෝෂණය කරත්වා! මෙම ඉගෙනීමෙන් අප දෙදෙනාටම ශක්තිය ලැබේවා! අධ්‍යාපනය නිසා අප දෙදෙනාටම ආලෝකය ලැබේවා! එකිනෙකාට වෛර කිරීමට හෙලා දැකීමට නොපෙලඹේවා ඕම් ශාන්ති! ශාන්ති! ශාන්ති!"

-පෞරාණික හින්දු කවියක්-



දරුවකුගේ නොසන්සුන් හැසිරීම් හා පාසල් වැඩට දක්වන අදක්ෂතාවන්ට හේතුව වර්ධක අසාමාන්‍යතාවක් (Development Disorder) විය හැකිය.

## අවධානය අවමතාව/අධික්‍රියාශීලී අසාමාන්‍යතාව (Attention Deficit /Hyperactivity Disorder)

වැඩිහිටියන්ට අවධානයෙන් සවන්දීමත්, එහිදී ලැබෙන අවවාදයන්ට අනුව හැසිරීම මෙන්ම නොඉවසුම් සහගත හා කලබලකාරී හැසිරීම් පාලනය කර ගැනීමත්, දරුවන් වෙතින්. වැඩිහිටියන් විසින් බලාපොරොත්තු වන දෑ අතර මුල් පෙළට වැටේ. එහෙත් ජීව විද්‍යාත්මක අසාමාන්‍යතා හේතුකොට ගෙන සමහර දරුවන්ට මේ බලාපොරොත්තු ඉටු කිරීම ඉතා අපහසු බව වැඩිහිටියන් විසින් අවධාරණයෙන්ම තේරුම් ගත යුත්තකි.


අවධානය අවමතාවෙන් හෝ අධික්‍රියාශීලී අසාමාන්‍යතාවෙන් පෙළෙන දරුවන් වෙතින් දක්නට ලැබෙන ප්‍රධානතම රෝග ලක්‍ෂණ කිහිපයකි. අවධානය එක් තැනක ලබා ගැනීමට ඇති දැඩි අපහසුතාව, අධි ක්‍රියාකාරීත්වය, කලබල සහිත බව හා නොසන්සුන් බව, ඉන් ප්‍රධානය. මෙම රෝග ලක්‍ෂණ එකක් හෝ කිහිපයක් එකවර දරුවකු තුළ ඇති විය හැකිය. මෙවැනි අසාමාන්‍යතාවන්ගෙන් පෙලෙන දරුවෝ තම අවධානය එක් කාර්යයක් හෝ එක් දෙයක් වෙත රඳවා තබා ගැනීමට දැඩි අපහසු බවක් දක්වති.

මේ නිසාම මෙවැනි දරුවෝ පැවරුම් සම්පූර්ණ කිරීමටත්, පාඩමට අවධානයෙන් සවන්දීමටත් ඉතා අපහසු අය බවට පත්වෙති. අවධානය අවමතාවට අමතරව මෙවැනි දරුවෝ, විටෙක අධික්‍රියාශීලී වෙති. පාසල තුලදී මෙවැන්නන් නොසන්සුන්, ("ඇඹරෙනවා" "නලියනවා" "තත්පරයක් එකවිදිහට ඉන්න බැරි") දරුවන් ලෙස හැඳින්වෙන අවස්ථාද ඇත. "කලබලකාරී බව හා හිතාමතා කටයුතු නොකරන්නන්" යයිද මෙම දරුවන්ට නැගෙන තවත් චෝදනාවන්ය. පාඩමක් අතරතුරදී, ගුරුවරයා ප්‍රශ්නයක් අසා අවසන් කරන්නටත් මත්තෙන් උත්තරය හඩනගා කීමට උත්සාහ කිරීම මෙයට එක් නිදසුනකි.



ඉහතකී හේතු නිසා, ඔවුන් අතරින් විශේෂයෙන්ම ඉහළ ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාකාරකම් බොහෝ විට අඩපණ වේ. එක් අරමුණක් වෙත අවධානය රඳවා තබා ගැනීමට ඇති නොහැකියාවත්, කලබලකාරී ගතියත් හේතුවෙන් මිතුරන් ගුරුවරුන් වැනි අය සමග නිසි පරිදි සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමට නොහැකිවේ. එවිට දරුවා සිය පාසල් මිතුරන් අතර ඉබේම කොන්වී අප්‍රසාදයට පත්වේ. මීට දෙමාපියන්ගෙන් හා ගුරුවරුන්ගෙන් නිතර අසන්නට ලැබෙන අයහපත් ප්‍රතිචාරද (දඩුවම් කායික/මානසික) එක් වු විට දරුවා තුල හීන මානයක් වර්ධනය වීම වැලැක්වීය නොහැකි තරම්ය.

LIBRARY
NATIONAL CHILD PROTECTION AUTHORITY
No: 330, Thalawathu... Road,
Madiwela, Kotte.
Sri lanka



පාසලෙන් පරිබාහිරව පවතින විවිධ සමාජයීය ගැටළුද, පාසල තුළ ගැටළු ඇති කරන්නට සමත් විය හැකිය. ඒ අතර පහත සඳහන් සාධක මුලිකව හඳුනාගත හැකිය. එනම්

- යුද්ධය නිසා පැන නැගී ඇති විවිධාකාර සමාජ දූෂණ පාසල තුළට ඇතුළු වීම.
- අනාගතය පිළිබදව ඇති අවිනිශ්චිතභාවය හා බිය.
- යුද්ධයට ගොස් ඇති හිතවතුන්ගේ ආපසු පැමිණීම පිළිබද ඇති අවිනිශ්චිතභාවය.
- කල්ලිවාදී මානසිකත්වය (තනිව හා වඩා නිවැරදිව ගන්නා තීරණ වලකාලීමට මෙය බොහෝ විට හේතුවෙයි.)
- සමාජය තුල සිදුවන මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය.

**පාසල තුල පවත්නා ගැටළු දරුවන් තුල නොසන්සුන් බව ඇති කරවිය හැකිය. එනම්**

- **පංති කාමරය තුළ සිසුන් වැඩිකම, ආලෝකය මදකම,** අධික තාපය, යපහත් පරිදි වාතාශ්‍රය නොලැබීම ආදී හේතු.
- මේස, පුටු ප්‍රමාණවත් නොවීම, අභ්‍යාස පොත් හා ගුරුවරුන හිගකම.

000577

**ගුරුවරුන් නිසාද පංති කාමර තුල විනය පිළිබද ගැටළු මතුවිය හැකිය. එනම්.**

- පාඩමට ප්‍රමාණවත් සූදානමක් නොමැති වීම,
- ඉගැන්වීමේ ක්‍රමවල ඇති දුර්වලතා.
- පාඩම පිළිබදව සිසුන් දක්වන උදාසීන බව.
- සිසු පාලනයේ ඇති දුර්වලතා.
- සිසුන් පිළිබදව ගුරුවරුන් තුල ඇති අශුභවාදී ආකල්ප.
- කාලයේ වටිනාකම පිළිබදව ඇති අවතක්සේරුව.
- පාසල තුලදී හා පිටතදී ගුරුවරයාගේ අවිනීත හැසිරීම් රටා.




NATIONAL CHILD PROTECTION AUTHORITY SRI LANKA
Date 08/12/2009
★ LIBRARY ★



## අපට කල හැක්කේ කුමක්ද?

සිසුනට ශාරීරික දඬුවම් පමුණුවනවා වෙනුවට වෙනත් අමානුෂික හා නින්දිත දඬුවම් පැමිණවීම ද නොකළ යුක්තකි. එහෙයින් සිසුන් හික්මවීමට යොදාගත හැකි වඩා ඵලදායි ආදේශන ක්‍රම පිළිබඳව වැඩිහිටියන් දැනුවත් වීම වැදගත් වේ.

දරුවන් හික්මවීමේ වගකීම හා එහිදී පැන නගින ගැටළු, ගුරුවරුන් නැමැති එක් වැඩිහිටි කොටසක් මත පමණක් පැටවීම නොකළ යුක්තකි. ගුරුවරුන් මෙන්ම දෙමාපියන්ද දරුවන් හික්මවීමේ ක්‍රියාවලියේ ප්‍රධාන දායකයන් විය යුතුය. ජන සමාජයේ සෑම සාමාජිකයෙකුම පාහේ දරුවන්ව වඩා ඵලදායී හා සුභවාදීව හික්මවීම් (පාලන) විධික්‍රම සම්බන්ධයෙන් දැනුවත් වීම හා එයට සහයෝගය දැක්වීම සිදුකල යුතුවේ. හික්මවීම් විධික්‍රම එක් අයෙකුට පමණක් ස්ථාපනය කල නොහැක්කකි. එය නිවැරදි වැටහීමක් සමඟ සමාජය තුළින්ම ඇතිවිය යුත්තකි. ගුරුවරුන්, දෙමාපියන්, දරුවන් ආදීවූ සෑම අයෙකු තුළම හික්මීම හා හික්මවීම යනු කුමක්ද? යන්න පිළිබදව සාමාන්‍යය වැටහීමක් නැතිවා නොවේ. එහෙත් වඩා ඵලදායී හා සුබවාදී ඉලක්කයන් කරා යාමේදී නිවැරදි මග පෙන්වීමක් හා ආගමික, නීතිමය හා ජනමාධ්‍ය අංශ ඇතුළුව සමස්ත සමාජයේම සහයෝගය ලැබීම අත්‍යවශ්‍යයෙන්ම සිදුවිය යුත්තකි.

දරුවන්ගේ විනය හා හික්මීම සම්බන්ධ ගැටළු පැන නැගීම සඳහා හේතු රාශියක් තිබිය හැකිය. එවා පිළිබඳව අප මදක් සිතා බලන්නේ නම් එම ගැටළු පිළිබදව මනා වැටහීමක් ඇති කර ගැනීම එතරම් අපහසු නොවේ.

**ගෙදර දොර පවත්නා යම් කිසි ගැටළු සහගත තත්ත්වයන් නිසා දරුවන් තුළ නොඉවසුම් සහගත බව, කලබලකාරී බව ආදීවූ නොයෙකුත් කරදරකාරී හැගීම් ඇතිකර වන්නට පුළුවන මෙවැනි හැගීම් ඇති කරවිය හැකි හේතුන් අතරින් ප්‍රධාන සාධක කිහිපයකි. එනම්**

- දිළිඳු බව.
- නිසි ලෙස දරුවන් රැක බලා නොගැනීම.
- දෙමාපියන් තුල පවත්නා අසතුට.
- දෙමාපියන් (බොහෝ විට පියා) මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතා කිරීම.

මෙහි ප්‍රතිඵලයක් ලෙස දරුවන් තුල බිය, පාලුව, අවුල් සහගත බව (වික්ෂිප්ත බව). වරදකාරී බව හා තරහව වැනි සිතුවිලි ඇති විය හැක. මෙවැනි සිතුවිලි නිසා දරුවන් තුළ පාසල් වැඩට යෙදවිය යුතු කායික හා මානසික ශක්තීන්ද, උද්යෝගයද හීන වී යා හැක. පවුලේ දිළිඳු බව හා දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සිසුන් පාසල් නොපැමිණීමට පමණක් නොව, ඇතැම් විට පාසල හැර යාමටද හේතුවක් විය හැකිය.



# ළමා අනාචාර යනු කුමක්ද?



අනවශ්‍ය ලෙස තරවටු කිරීම



අනවශ්‍ය ලෙස සමච්චලයට ලක් කිරීම



අසභ්‍ය ක්‍රියා වලට යොමු කිරීම



ළමයාව අයුතු ලෙස ස්පර්ශ කිරීම



තමාව අයුතු ලෙස
ස්පර්ශ කිරීමට ළමයාට බල කිරීම



ළමයාගේ ආත්ම විශ්වාසය
පළුදු කිරීම



ඔබේ මානසික පීඩනය
සමනය කරගැනීමට ළමයාට
ශාරීරික වදහිංසා කිරීම



වරදකට පෙළඹවීම සහ අනතුරක්
සිදුවීමට ඉඩහැරීම



ළමයාගේ ඇඳුම් පැළඳුම් හා
පවිත්‍රතාව ගැන සැලකිලිමත් නොවීම



ළමයින් මෙහෙකාර සේවයේ
යෙදවීම




ළමයාට ඇහුම්කන් නොදීම



ළමයා බලාපොරොත්තු වන ආදරය
ලබා නොදීම



ළමයා තම නිවස තුළම
මෙහෙකාරියක් වීම නිසා අධ්‍යාපනයට /
ක්‍රීඩාවට කාලය නොමැති වීම



මානසික හා ශාරීරික පීඩාවට
ලක්වන ලෙස දඬුවම් කිරීම



ළමයාගේ ලෙඩදුක් ගැන නොසලකා හැරීම




ළමයින් පාස ල් නොයැවීම



ළමයා අනාරක්‍ෂිතව තැබීම.

ජාතික ළමා ආරක්‍ෂක අධිකාරිය
(N.C.P.A)
205/1, කාසල් වීදිය,
කොළඹ-08.
දුරකථන: 672911-4
ෆැක්ස්: 672915